(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

**අංක 1(6).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 අප්‍රේල් 05 සිකුරාදා**

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2024 අප්‍රේල් 24 බදාදා)**

2039/2024

ගරු විජිත හේරත් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 ජනවාරි සිට මේ දක්වා සංචාරක කර්මාන්තය ආශ්‍රිතව සේවා සපයන්නන් සංඛ්‍යාව එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් අතරින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති සහ නොමැති හඳුනාගත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් ලියාපදිංචි කරන ක්‍රමවේදය කවරේද;

(iv) ලියාපදිංචි සේවා සපයන්නන් අතරින් 2022 ජනවාරි සිට මේ දක්වා ලියාපදිංචිය අවලංගු කළ සංඛ්‍යාව කොපමණද;

(v) එම එක් එක් සේවා සපයන්නාගේ නම, ලිපිනය, ව්‍යාපාර නාමය, ලියාපදිංචිය අවලංගු කළ දිනය, අවලංගු කිරීමට හේතුව සහ ඒ සඳහා නිර්දේශ කරන ලද නිලධාරියාගේ නම හා තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සංචාරක කර්මාන්තයට අදාළ සංචාරක සංගම්වලින්/ආයතනවලින්/පුද්ගලයන්ගෙන් 2022 ජනවාරි සිට මේ දක්වා සංචාරක සංවර්ධන අධිකාරියට ලැබී ඇති පැමිණිලි/අභියාචනා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි/අභියාචනා ඉදිරිපත් කළ සංගමයේ/ආයතනයේ/පුද්ගලයාගේ නම, ලිපිනය, පැමිණිල්ල/අභියාචනය ලැබුණු දිනය සහ ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත පැමිණිලි/අභියාචනා සඳහා නිසි ක්‍රියාමාර්ග නොගත්තේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2040/2024

ගරු විජිත හේරත් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2022 සිට 2023 දක්වා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති එක් එක් සේවා සපයන්නාගේ නම, ලිපිනය, ව්‍යාපාරික නාමය, ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ දිනය, තාවකාලික සහ ස්ථිර ලියාපදිංචි සහතිකය නිකුත් කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තාවකාලික සහතික හා ස්ථිර සහතික නිකුත් කිරීමට පෙර සේවා සපයනු ලබන ස්ථාන පරීක්ෂා කළේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) පරීක්ෂා කළේ නම්, දිනය, නිලධාරින්ගේ නම්, තනතුරු, නිරීක්ෂණ, භාවිතා කළ වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය, හිමිකරුගේ නම, ගෙවූ මුදල හා ගෙවීම් සිදු කළ ආකාරය එක් එක් ස්ථානය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) කිසිදු පරීක්ෂාවක් නොකර තාවකාලික සහතිකය දීර්ඝ කළ සංචාරක ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(vi) එම එක් එක් ව්‍යාපාර ස්ථානය හිමිකරුගේ නම, ව්‍යාපාර නාමය, තාවකාලික සහතිකය දීර්ඝ කළ දිනය, දීර්ඝ කිරීමට නිර්දේශ කළ නිලධාරියාගේ නම සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2041/2024

ගරු විජිත හේරත් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2022 සිට 2023 දක්වා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් විදේශීය රටවල ක්‍රියාත්මක කරන ලද ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වැඩසටහනේ නම, ක්‍රියාත්මක කරන ලද රට, දිනය, ඒ සඳහා ඉහත කාර්යාංශය විසින් දරන ලද වියදම, ගුවන් ගමන් ටිකට්පත්, නවාතැන් පහසුකම් ඇතුළුව දරන ලද වෙනත් වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් වැඩසටහන් සඳහා ඉහත කාර්යාංශය/බාහිර ආයතන නියෝජනය කරමින් සහභාගී වූ පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වැඩසටහන සඳහා සහභාගී වූ බාහිර පුද්ගලයන් තෝරා ගන්නා ලද ක්‍රමවේදය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 මැයි 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෑම වර්ෂයකම අධික වියළි කාලගුණ තත්ත්ව පවතින කාලවලදී මහනුවර, පන්විල සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශ ඇතුළු මධ්‍යම කඳුකරයේ බොහෝ ප්‍රදේශවල රක්ෂිත වනාන්තර, ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිත වනාන්තර සහ කුඩා ලඳු කැළෑ ගිනි තබන බවත්;

(ii) ඒ හේතුවෙන් ජල උල්පත් සිඳීයාම, වර්ෂා කාලයට කඳු මුදුන්වල ඇති ගල් පෙරළීම හා නාය යාම් ඇති වීම වැනි හානි සිදු වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත ගිනි තැබීම් වැළැක්වීම සඳහා පියවර ගෙන තිබේද;

(ii) උණුසුම් කාලගුණයත් සමඟ ගිනි ගැනීම් සීඝ්‍රයෙන් පැතිරීම පාලනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) සංවේදී පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා තිරසර විසඳුමක් ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම විසඳුම කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

41/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1948.02.04 දිනෙන් පසුව මරණ දඬුවම නියම කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ එල්ලා මරණයට පත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එල්ලා මරණයට පත් කරන පුද්ගලයින්ගේ මරණ සහතික ඥාතීන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු අග්‍රාමාත්‍ය ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ඝාතනය කිරීම සම්බන්ධයෙන් වැරදිකරු වූ තල්දූවේ සෝමාරාම හිමියන්ගේ මරණ සහතිකය මෙතෙක් නිකුත් කර නොමැති බවත්;

(ii) 1962.07.06 දින තල්දූවේ සෝමරාම හිමි එල්ලා මැරූ බවට සඳහන් වුවද එදිනට එම නමින් මරණයක් ලියාපදිංචි වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) තල්දූවේ සෝමරාම හිමියන්ගේ මරණ සහතිකය නිකුත් නොකිරීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එහි නිගමනය කවරේද;

(iii) නොඑසේ නම්, පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් පසු අදාළ මරණ සහතික නිකුත් නොකළ තවත් පුද්ගලයන් සිටීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

309/2024

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටේ සුභසිද්ධිය වෙනුවෙන් ජාත්‍යන්තර සම්බන්ධතා සහ අධ්‍යාපන වැඩසටහන් සඳහා 2020.08.20 සිට අද දක්වා නවවැනි පාර්ලිමේන්තුවේ කථානායකවරයා සහභාගි වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය සඳහා සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් හා නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත විදේශ සංචාරවලින් අත්පත් කර ගනු ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

355/2024

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා පත් කළ දිනය;

(ii) එදිනට සහ 2024.01.31 දිනට එක් එක් පරිභෝජන කාණ්ඩයේ විදුලි ඒකකයකට අය කළ ගාස්තුව සහ එම ගාස්තුවේ වැඩි වීම ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) (අ)(i)හි සඳහන් දිනට සහ 2024.01.31 දිනට;

(ii) (අ)(i)හි සඳහන් දිනයේ සිට 2024.01.31 දින දක්වා රතු බිල් නිකුත් කළ සහ විදුලිය විසන්ධි කළ;

විදුලි පරිභෝගිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011.01.01 දිනයේ සිට 2020.12.31 දින දක්වා නව විදුලි සම්බන්ධතා ලබා ගත් සහ විදුලිය විසන්ධි කළ පාරිභෝගිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) ඒ අතර වෙනස;

(iii) (අ)(i)හි සඳහන් දිනයේ සිට 2024.01.31 දක්වා විදුලි සම්බන්ධතා ලබා ගත් සහ විදුලිය සම්බන්ධතාවය විසන්ධි කළ පාරිභෝගිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iv) ඒ අතර වෙනස;

(v) වර්තමාන අමාත්‍යවරයාගේ ධුර කාලයේදී විදුලි සම්බන්ධතා ලබා ගත් සහ විදුලිය සම්බන්ධතාවය විසන්ධි කළ විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව වාර්ෂික සාමාන්‍ය අගයක් ලෙස;

කොපමණද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

356/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල් සංඛ්‍යාව, සිංහල මාධ්‍ය, දමිළ මාධ්‍ය සහ සිංහල හා දමිළ මාධ්‍ය ලෙස;

(ii) එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, 10ට අඩු, 10-20 අතර, 20-50 අතර, 50-100 අතර සහ 100-200 අතර යන වර්ගීකරණය මත;

(iii) රජයේ පාසල් අතරින් අ.පො.ස. (උසස් පෙළ) සඳහා ගණිතය, විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව;

(iv) අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) විෂය ධාරාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබන රජයේ පාසල් සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

366/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ‘හඳුනා නොගත්’ වකුගඩු රෝගය වැළඳී ඇති රෝගීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වකුගඩු රෝගීන් බහුල වශයෙන් වාර්තා වන දිස්ත්‍රික්ක සහ එම එක් එක් දිස්ත්‍රික්කයෙන් වාර්තා වන වකුගඩු රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වකුගඩු රෝගීන් වාර්තා වන අනෙකුත් දිස්ත්‍රික්ක සහ එම එක් එක් දිස්ත්‍රික්කයෙන් වාර්තා වන වකුගඩු රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වකුගඩු රෝගියකු සඳහා රජය විසින් ලබා දෙනු ලබන මාසික දීමනාව කොපමණද;

(ii) මේ වනවිට එම දීමනාව ලබන වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2042/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසු රජයේ සේවකයන්ට මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කිරීමට මාස දහයකට අධික කාලයක් ගතවන බවත්;

(ii) එම ප්‍රමාදය හේතුවෙන් සමහර රජයේ සේවකයන් සිය ප්‍රථම විශ්‍රාම වැටුප ලැබීමට පෙර මිය යන අවස්ථා ඇති බවත්;

(iii) එම ප්‍රමාදය රජයේ සේවකයන්ට කරනු ලබන දැඩි අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රමාදයට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2055/2024

ගරු වේලු කුමාර් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුනෙස්කෝ සංවිධානය විසින් මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බවත්;

(ii) ශ්‍රී ලංකාවට ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන රාශියක් එම නගරයේ පිහිටා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනාගෙන ඇති පූජනීය ස්ථාන සහ ගොඩනැගිලි කවරේද;

(ii) ඒවා ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් මූල්‍යාධාර ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ලබා දෙනු ලබන වාර්ෂික මූල්‍යාධාරය කොපමණද;

(iv) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනාගෙන ඇති පෞද්ගලික ගොඩනැගිලි කවරේද;

(v) එම ගොඩනැගිලි හිමිකරුවන්ටද කිසියම් මූල්‍යාධාරයක් ලබා දෙන්නේද;

(vi) එසේ නම්, එම මූල්‍යාධාරය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ)(i)හි සඳහන් ස්ථාන ඒ අයුරින්ම පවත්වාගෙන යන්නේද;

(ii) ඒවායේ වෙනස්කම් සිදු කිරීමට අවසර ලබා දී තිබේද;

(iii) මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2073/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලි ගාස්තු අඩු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ/නියාමන සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිර්දේශ/නියාමන කවරේද;

(iii) විදුලි ගාස්තු අඩු කිරීම තාර්කික නොමැති බවත්, එහිදී මහජන අදහස්වලට සවන් දී නොමැති බවත් සිවිල් සංවිධාන විසින් චෝදනා කරන බව දන්නේද;

(iv) එසේ නම්, එම චෝදනා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2081/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට මත්පැන් නිෂ්පාදනය කරනු ලබන නීත්‍යානුකූල ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම සහ ලිපිනය, හිමිකරුගේ නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2020 සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් ගෙවා ඇති බදු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතන විසින් ගෙවිය යුතු හිඟ බදු මුදල් තිබේද;

(v) එසේ නම්, එම බදු මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 මැයි 08 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

371/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලසාර්ඩ්-ප්‍රාන්ස් සමාගමෙන් (M/S Lazards-France) මූල්‍ය උපදේශන සේවා ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය ගිවිසුමකට එළැඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම අනුව ඉහත සමාගමේ මූලික වගකීම් කවරේද;

(iii) ඉහත ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු මුදල හා මේ වනවිට ගෙවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් හා එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්ලිෆර්ඩ් චාන්ස් (M/S Clifford Chance LLP) සමාගමෙන් නීති උපදේශක සේවා ලබා ගැනීමට රජය ගිවිසුමකට එළැඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම අනුව ඉහත සමාගමේ මූලික වගකීම් කවරේද;

(iii) ඉහත ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු මුදල හා මේ වනවිට ගෙවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් හා එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

378/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(ii) වර්ෂ 2018 සිට 2022 දක්වා එම සංස්ථාවේ ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සංස්ථාව අලාභ ලබන්නේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම අලාභ මඟහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟ මුදල් ගෙවීමට ඇති ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනයෙන් ලැබිය යුතු හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

464/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— වනජීවී හා වන සංරක්ෂණ කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල පවතින කළුගල් කඩා ඉවත් කිරීමට අවසර ලබා දීමේ ගාස්තු ලෙස, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කළුගල් කඩා ඉවත් කිරීමේ ගාස්තුව 50%කින් අඩු කිරීමට තීරණය කරන ලද දිනය කවරේද;

(iii) ගාස්තු අඩු කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(iv) ඒ හේතුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමි වූ මුදල ඉහත (ii)හි සඳහන් තීරණය ක්‍රියාත්මක කරන ලද දිනයේ සිට අද දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (ii)හි සඳහන් තීරණය සාධාරණීකරණය කිරීමට ඇති හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

509/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට විවෘත හා සීමිත තරඟ විභාග යටතේ බඳවාගන්නා ලද නිලධාරින් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය සහ වර්තමාන සේවා ස්ථානය;

(iii) ඉහත නිලධාරින් අතරින් වර්ෂ 2018 සිට මේ දක්වා ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරින් සංඛ්‍යාව, එම එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය සහ සේවා ස්ථානය;

(iv) ඉහත (iii)හි සඳහන් නිලධාරින් අතරින් මේ දක්වා ස්ථාන මාරුවීම් ලබා ඇති සහ ස්ථාන මාරුවීම් ලබා නොමැති නිලධාරින් සංඛ්‍යාව, එම එක් එක් නිලධාරියාගේ නම සහ සේවා ස්ථානය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු සේවය වැනි සේවාවල මෙන් සාධාරණ ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1242/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පිහිටුවා ඇති ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත පොලිස් ස්ථානවලට හා වෙනත් රාජකාරිවලට යොදවා ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකා පොලිස් සේවයේ පුරප්පාඩු පවතී නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ආරක්ෂාව සඳහා යොදවා ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැර වෙනත් පුද්ගලයන්ගේ හෝ ආයතනවල ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරින් යොදවා තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව එක් එක් පුද්ගලයා/ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 මැයි 09 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

540/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සිනමා ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට චිත්‍රපටි ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා ජාතික චිත්‍රපටි සංස්ථාව විසින් ප්‍රදර්ශනය කර ඇති චිත්‍රපටි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2019 සිට මේ දක්වා චිත්‍රපටි නිෂ්පාදනය කිරීම සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

563/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ඉඩම්වල වගා කර ඇති බෝග වර්ග කවරේද;

(iii) සංස්ථාව සතු ඉඩම් අතරින් කෙටිකාලීන වගාවන් සඳහා බදු දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩම් පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(v) එම ඉඩම් බදු දීමෙන් මේ වනවිට උපයා ගෙන ඇති ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

589/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022.12.31 දිනට ශ්‍රී ලංකාවේ මුළු රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව එක් එක් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2019.01.01 සිට 2019.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2020 සිට 2022 දක්වා බඳවාගන්නා ලද සහ විශ්‍රාම ගන්වන ලද රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2023.01.01 දිනට මුළු රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට රාජ්‍ය සේවයේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය කාලයේ ඇති වූ පුරප්පාඩු නොපිරවීම හේතුවෙන් රාජ්‍ය සේවයේ බිඳවැටීමක් සිදු වූ බව පිළිගන්නේද;

(iv) එම බිඳවැටීම වළක්වා ගනිමින් රාජ්‍ය සේවය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

613/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.01.01 දින වනවිට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති මත්පැන් බලපත්‍ර වර්ග කවරේද;

(iii) එම එක් එක් මත්පැන් බලපත්‍ර වර්ගය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2023.01.01 දින සිට 2024.01.01 දින දක්වා ලබා දී ඇති මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(v) එම සංඛ්‍යාව, මේ වනවිට ලබා දී ඇති මුළු මත්පැන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(vi) එම ප්‍රතිශතය, එක් එක් මත්පැන් බලපත්‍ර වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මත්පැන් සුලභ වීම, මත්පැන් පරිභෝජනය ඉහළ යැමට ප්‍රධාන හේතුවක් බවත්;

(ii) එමඟින් මත්පැන් ආශ්‍රිත රෝග ඉහළ යාමෙන් සෞඛ්‍ය සඳහා වෙන් කළ යුතු මුදල ඉහළ යන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

637/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට වසා දමා ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල ඇති ඉඩම් සහ ගොඩනැගිලි වෙනත් ඵලදායී කටයුතු සඳහා භාවිතා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂයේදී අධ්‍යාපනය සඳහා විදේශ ගත වී ඇති මුළු ශ්‍රී ලාංකික සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් වෙනුවෙන් එක් වර්ෂයකට වැය කිරීමට සිදු වන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට ගුරු සේවයට අන්තර්ග්‍රහණය කර ඇති සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පවතින විදුහල්පතිවරුන්ගේ හිඟය මගහැරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1091/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා දුම්රියවල ගැටීම හේතුවෙන් ජීවිතක්ෂයට පත් වී ඇති වන අලින් සංඛ්‍යාව කොපමණද;

(ii) දුම්රියවල වන අලින් ගැටීම වළක්වා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් තිබේද;

(iii) මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) වන අලින් දුම්රියවල ගැටීම වළක්වා ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1127/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලි ගාස්තු ඉහළ යාම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් දැඩි දුෂ්කරතාවයට පත් වී ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ සිටින විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා විසිතුරු මත්ස්‍යයන් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1148/2024

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.01.01 දින සිට මේ දක්වා රැකියා සඳහා විදේශ ගත වී ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව සේවය කරනු ලබන රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා සඳහා ඉදිරියේදීත් ශ්‍රී ලාංකිකයන් යොමු කිරීමේ අවස්ථාව සැලසී තිබේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) එම විදේශ රැකියා අවස්ථා සඳහා ශ්‍රී ලාංකිකයන් යොමු කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1153/2024

ගරු නීතීඥ මධුර විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පාලනය කරනු ලබන පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා එම ස්ථානවල විධිමත් සනීපාරක්ෂක පහසුකම් සලසා දී තිබේද;

(iii) පුරාවිද්‍යා ස්ථානවලට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ කවරේද;

(iv) පුරාවිද්‍යා ස්ථානවල අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හා නව ඉදිකිරීම් වැළැක්වීමට නිසි ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුරාවිද්‍යා ස්ථාන දැක්වෙන නිල වෙබ් අඩවිය යාවත්කාලීන කර තිබේද;

(ii) එසේ නම්, කොපමණ කාලයකට වරක් යාවත්කාලීන කිරීම් සිදු කරනු ලබන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1250/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පසුගිය වසර කිහිපය තුළ ඉහළ ගිය ජීවන වියදමට සාපේක්ෂව තේ වතු කම්කරුවන්ගේ දෛනික වැටුප වැඩි කිරීමේ ප්‍රගතිය කවරේද;

(ii) එවැනි ප්‍රගතියක් තිබේ නම්, එම වැටුප් වැඩිවීමේ ප්‍රමාණය කවරේද;

(iii) එම වැඩිවීම ගෙවනු ලබන දිනය කවරේද; සහ

(iv) එවැනි ප්‍රගතියක් නොමැති නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා මුහුණ දෙන බාධා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

---

**2024 මැයි 10 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1253/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද ;

(ii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම කාර්යාංශය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම ක්‍රියාවලියේ ස්වාධීනත්වයට බලපෑම් එල්ල වන බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අනාවරණය වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) මේ වනවිට දූෂිත ආයතනයක් බවට පත් වී ඇති ඉහත ආයතනය, එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1282/2024

ගරු අසංක නවරත්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සතුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් බෝග වගාවන්ට වාර්ෂිකව සිදු වන හානිය සම්බන්ධයෙන් තක්සේරුවක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) එම හානි අවම කර ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1287/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා එම අරමුදල මඟින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අරමුදලට මුදල් ලැබෙන මාර්ග කවරේද;

(v) එම අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1701/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිවාස තුළ සිදු වන ස්වභාවික මරණ ලියාපදිංචි කිරීමේදී, මරණය සිදු වන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයාගේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ස්වභාවික මරණයකදී, මරණයට පත් වූ පුද්ගලයාගේ මරණයට හේතුව තහවුරු කර ගනු ලබන නීත්‍යානුකූල ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1703/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවය කරනු ලබන අනධ්‍යන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ තනතුරු නාම කවරේද;

(iii) නිශ්චිත රාජකාරි ලැයිස්තුවකින් ඔවුන්ට රාජකාරි පවරා දී තිබේද;

(iv) ඉහත සේවකයන් සඳහා උසස්වීම් පටිපාටියක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයන් අතරින් මේ වනවිට උපාධිය සම්පූර්ණ කර ඇති සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) උපාධිය හා පළපුරුද්ද සැලකිල්ලට ගෙන ඔවුන් ගුරුවරුන් ලෙස බඳවාගැනීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1728/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ ඇති ජාතික පාසල් හා පළාත් සභා පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1738/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල ඇති ඉඩම් මෑතක සිට රජය මඟින් අත්පත් කර ගනු ලබන බවත්;

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉරක්කකණ්ඩි, පුල්මුඩේ, කින්නියා, මුතූර් සහ තෝප්පූර් යන ප්‍රදේශවල ඉඩම්, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඒවායේ හිමිකරුවන්ගේ අවසරයකින් තොරව මැනුම් කටයුතු සිදු කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මැනුම් කටයුතු සිදු කිරීමට හේතුව කවරේද;

(ii) ඉහත සඳහන් පරිදි ඉඩම් අත්පත් කර ගැනීම, එම ඉඩම්වල පාරම්පරිකව කෘෂිකර්මික කටයුතු සිදු කරනු ලබන ගොවීන්ගේ ජීවනෝපායට අහිතර ලෙස බලපාන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1750/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම බලාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල කොපමණද;

(iii) එම බලාගාරයෙන් ජාතික ජාලයට එකතු කිරීමට අපේක්ෂා කරනු ලබන විදුලි ප්‍රමාණය මෙගා වොට්වලින් කොපමණද;

(iv) එම විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1877/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ, එම ව්‍යාපෘතිය අවට පිහිටා ඇති ගම් රැසක ජනතාව වනඅලි තර්ජනයට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මානවල ජීවත් වන මේ වනවිට වනඅලි තර්ජනයට මුහුණ දී සිටින පවුල් සංඛ්‍යාව එක් එක් ගම්මානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම වනඅලි තර්ජනය විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1909/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්මලාන ඩිපෝව මඟින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබූ ගල්කිස්ස ප්‍රධාන බස් නැවතුම්පළ, එම ස්ථානයෙන් ඉවත් කිරීමට බලපාන ලද හේතු කවරේද;

(ii) එම ප්‍රධාන බස් නැවතුම්පළ ස්ථාපිත කිරීම සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩමේ මුල් අයිතිකරුගේ නම සහ ඉඩමේ පිඹුරුපත් අංකය කවරේද;

(iii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iv) එම ප්‍රධාන බස් නැවතුම්පළ ස්ථාපිත කිරීම සඳහා භාවිතා කර තිබූ ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(v) ප්‍රධාන බස් නැවතුම්පළ ස්ථාපිත කිරීම සඳහා එම ඉඩම අත්පත් කර ගන්නා ලද වර්ෂය කවරේද;

(vi) මේ වනවිට ඉහත ඉඩම අයත් ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.30/2024

ගරු වේලු කුමාර් මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම,— ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ රටක් වන හෙයින් ද, පසුගිය කාලය පුරාවටම ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රියාකාරකම් අස්ථාවර තත්ත්වයක පැවති හෙයින් ද, ඉතා දක්ෂ ක්‍රීඩකයන් බොහොමයක් සිටින වතු ප්‍රදේශවලට ද ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔවුන්ගේ දායකත්වය ද ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා ලබා ගැනීමට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට ප්‍රජාවගේ පාරම්පරික කලා ශිල්ප වාණිජ කටයුත්තක් දක්වා වර්ධනය කිරීම,— වැවිලි ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගත් ඉන්දියානු සම්භවයක් සහිත කඳුරට ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත ජන සමාජය නියෝජනය කරනු ලබන එක් ජන කොටසක් වන හෙයින් ද, නාඩගම්, කොහොඹකළේ නැටුම, කාවඩි නැටුම්, ලී කෙළි වැනි අංගයන්ගෙන් යුත් පාරම්පරික කලා ශිල්ප මෙම ජන සමාජය තුළ දක්නට ලැබෙන හෙයින් ද, එම කලා ශිල්ප ආරක්ෂා කොට වාණිජමය කටයුත්තක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් යෝග්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/2024

ගරු වේලු කුමාර් මහතා,— ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතියක් හා නියාමනයක් ඇති කිරීම,— දිවයිනේ බොහෝ ප්‍රදේශවල පෞද්ගලික පාර්ශ්වයන් විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන හෙයින් ද, වතු සමාගම් මඟින් පවත්වාගෙන යනු ලබන මෙවැනි මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක්, ක්‍රමවේදයක් හා නියාමනයක් සිදු නොවන හෙයින් ද, රටේ අනාගතය තීරණය කරන දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය උදෙසා එම මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක් සහ නියාමනයක් ඇති කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/2024

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශවල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/2024

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය ප්‍රකාශයට පත්කිරීම,— කඳුරට වතුකර කම්කරුවන් ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ එහි ආර්ථිකය වෙනුවෙන් සුවිශාල දායකත්වයක් ලබාදුන් ප්‍රජාවක් වන හෙයින් ද, ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ තම අයිතිවාසිකම් දිනා ගනිමින් එම අරගලයන් හි දී සිය ජීවිත පූජා කළ වෘත්තීය සමිති විරුවන් එක් පොදු දිනක දී සිහිපත් කිරීම මෙරට ජීවත්වන ඉන්දීය සම්භවයක් සහිත කඳුරට ජනතාවගේ දීර්ඝකාලීන ඉල්ලීමක් වන හෙයින් ද, 1939 දෙසැම්බර් සිට 1940 ජනවාරි දක්වා ශ්‍රී ලංකාවේ කඳුරට කම්කරු ප්‍රජාව විසින් වැටුප් වැඩි කරන මෙන් ඉල්ලා සිදු කරන ලද ප්‍රථම වෘත්තීය සමිති අරගලයේ දී සුදු ජාතිකයෙකු විසින් සිදුකරන ලද වෙඩි තැබීමකින් “මුල්ලෝයා ගෝවින්දන්” නමැති කම්කරුවා ජීවිතක්ෂයට පත් වූ හෙයින් ද, කඳුරට කම්කරු ප්‍රජාව විසින් සිදුකරන ලද අවිහිංසාවාදී අරගලයේ දී ජීවිතය පූජා කළ එම පළමු කම්කරුවා සහ ඉන් අනතුරුව කඳුරට කම්කරු ජනතා අයිතිවාසිකම් සහ සුභසාධනය සඳහා දියත් කෙරුණු බොහෝ වෘත්තීය සමිති

අරගලයන් හි දී ජීවිත පූජා කළ අනෙකුත් විරුවන් සැමරීම සඳහා එම පළමු වෘත්තීය සමිති විරුවා මියගිය දිනය වන ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/2024

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— 1798 වර්ෂයේදී ආරම්භ කරන ලදුව 1882 වර්ෂයේදී ඉංග්‍රීසීන් විසින් විධිමත් කරන ලද වසර දෙසීයකට අධික ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකා තැපැල් සේවය අප රට තුළ නිදහසින් පසුව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන රජය විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවක් වන හෙයින් ද, කඳුරට වතුකර ජනතාව මෙරට පදිංචි වී වසර දෙසීයක පමණ කාලයක් ගත වී ඇතත් ඔවුන් පදිංචි නිවාස වෙත සෘජුව ලිපි රැගෙන ගොස් භාර දීමක් සිදු නොවන හෙයින් එම ජනතාව විවිධ අපහසුතාවන්ට පත් වී සිටින හෙයින් ද, අවුරුදු දෙසීයක කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන මෙම ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

**2024 මැයි 13 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1912/2024

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2022 දක්වා මහනුවර, පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පවත්වා ඇති ජාත්‍යන්තර ක්‍රිකට් තරග සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් තරගයෙන් උපයාගෙන ඇති ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2010 සිට 2022 දක්වා එම ක්‍රීඩාංගනය නඩත්තු කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1917/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට මේ දක්වා කම්කරු ආරවුල් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට නිරවුල් කර ඇති සහ නිරවුල් කර නොමැති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා වන්දි ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1940/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2019 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක මට්ටමින් අලෙවි කර ඇති එම මණ්ඩලයේ ලොතරැයි පත් සංඛ්‍යාව සහ එමගින් උපයා ඇති ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා එම ආදායමෙන් ජනාධිපති අරමුදලට, මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට, භාණ්ඩාගාරයට සහ වෙනත් සුභසාධන කටයුතුවලට ලබා දී ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1968/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ තිබෙන රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා අතර බලපත්‍ර නොමැතිව ක්‍රියාත්මක කරනු ලබන රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) නව රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකා ආරම්භ කිරීම සඳහා ඉල්ලුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1994/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේ පළමු කාර්තුවේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මහරගම සහ හිරිපිටිය යන ශාඛාවල විශාල මූල්‍ය අවභාවිතාවක් සිදුවී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, අවභාවිතා කරන ලද මුදල කොපමණද;

(iii) මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා සතියක හෝ සති දෙකක කාලයක් ගත වීමට නිලධාරීන්ගේ අසත්භාවය හේතු වී තිබේද;

(iv) මෙම මූල්‍ය අවභාවිතාවයට සම්බන්ධ නිලධාරීන් කවුරුන්ද;

(v) එම නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(vi) අවභාවිතා කරන ලද මුදල නැවත අයකර ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මූල්‍ය අවභාවිතාව සම්බන්ධයෙන් එම ශාඛාවල ප්‍රධානීන් අවසාන වගකීම දැරිය යුතු වන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රධානීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2007/2024

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පිහිටි කුඹුරු පුරන්වීම, ආහාර නිෂ්පාදනය අඩුවීමට හේතු වී තිබෙන බව දන්නේද;

(ii) පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා යෝජනා කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(iii) ගොවීන් වී ගොවිතැනින් ඉවත් වීම හේතුවෙන් කුඹුරු පුරන් වී ඇති බව පිළිගන්නේද;

(iv) ගොවීන් වී ගොවිතැනින් ඉවත් වීම සඳහා බලපාන හේතු කවරේද;

(v) එම හේතු සඳහා ලබා දී ඇති විසඳුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වී ගොවිතැනට අදාළව අමාත්‍යාංශ මට්ටමින්, පළාත් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සිටින නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා නව ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රතිපත්තිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2023/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහිලූර් ප්‍රදේශයේ, මහිලූර් මධ්‍යම බෙහෙත් ශාලාව ස්ථාපිත කර ඇති බවත්;

(ii) ඉතා දීර්ඝ කාලයක් තිස්සේ ජනතාව පදිංචි වී සිටි ඉඩමක් අත්පත් කර ගෙන එම බෙහෙත් ශාලාව ස්ථාපිත කරන ලද බවත්;

(iii) එම ජනතාවට පදිංචි වීම සඳහා වෙනත් ස්ථානයක විකල්ප ඉඩම් ලබා දීමේදී පෙර පැවති ඉඩමට වඩා ප්‍රමාණයෙන් අඩු ඉඩමක් ඔවුන්ට ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මේ සඳහා විසඳුමක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඕන්තාච්චිමඩම්, කුරුමන්වෙලි, මහිලූර්, එරුවිල් යන ගම්මානවල ජීවත්වන ජනතාව ප්‍රයෝජන ලබන එම බෙහෙත් ශාලාව සඳහා ස්ථිර වෛද්‍යවරයෙක්, ගිලන්රථ සේවා පහසුකම්, ප්‍රමාණවත් ඇඳන් සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් අවශ්‍යතා සපුරාලීමට පියවර ගන්නේද;

(iii) එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2043/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැයකර ඇති මුදල කොපමණද;

(ii) එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා විදේශ පරිත්‍යාග ලැබුණේද;

(iii) එසේ නම්, එම එක් එක් විදේශ පරිත්‍යාගයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා අදාළ ආයතනය තෝරා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉදිකිරීම් විදේශ ආයතනයක් විසින් සිදුකරන ලද්දේ නම්, එහි ශ්‍රී ලාංකික නියෝජිතායතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැය කර ඇති රජයේ අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම අරමුදල් ලබා ගන්නා ලද ආයතන කවරේද;

(iii) එම ක්‍රීඩාංගණය විවෘත කරන ලද දිනයේ සිට මේ දක්වා එහි ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2056/2024

ගරු වේලු කුමාර් මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1992 වර්ෂයේදී රජයේ වතු ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද අවස්ථාව වනවිට මහනුවර දිස්ත්‍රික්කයේ, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් බෝහිල් වතුයායේ තිබූ ඉඩම් කොටස් (Divisions) සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉඩම් කොටස්වල නම් කවරේද:

(iii) ඉහත කොටස් අතරින් වර්ෂ 2015 වනවිට වගා නොකර අත්හැර දැමූ කොටස් පැවතියේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1992 සිට 2015 දක්වා වූ කාලයේදී ඉහත වතුයායේ ඉඩම් කොටස්/ගොඩනැගිලි බාහිර පුද්ගලයන්ට/පෞද්ගලික ආයතනවලට ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් පුද්ගලයාගේ/පෞද්ගලික ආයතනයේ නම සහ ලබා දෙන ලද ඉඩම්/ගොඩනැගිලි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් එක් එක් ඉඩම් කොටසේ/ගොඩනැගිල්ලේ පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද,

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2074/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශීය ආයෝජන මත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට යෝජිත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ව්‍යාපෘතියේ වටිනාකම සහ ජනනය කිරීමට අපේක්ෂිත විදුලිය ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 මැයි 14 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිරෝද රථ සේවාව තුළින් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කරනු ලැබුවද, එම සේවාව නියාමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත්;

(ii) ත්‍රිරෝද රථ රියදුරන් විසින් අක්‍රමවත් පරිදි මුදල් අයකිරීම හේතුවෙන් මගීන් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ත්‍රිරෝද රථ අතරින් මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ත්‍රිරෝද රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ත්‍රිරෝද රථ සේවාව නියාමනය කිරීම සඳහා මේ වනවිට විධිමත් ක්‍රමවේදයක් තිබේද;

(iii) ත්‍රිරෝද රථ රියදුරන් හඳුනාගැනීම සඳහා හැඳුනුම්පතක් හා නිල ඇඳුමක් හඳුන්වාදීමටත්, ත්‍රිරෝද රථයට මීටරයක් සවි කිරීමටත් යෝජනා කර තිබේද;

(iv) එසේ නම්, ඉහත යෝජනා ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

43/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතය වටා පිහිටි රක්ෂිත වනාන්තර 13ක් සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට ඇතුළත් කර එම වන රක්ෂිතයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර 30,000ක් දක්වා ඉහල නැංවීමට අදාළ ගැසට් නිවේදනයකට හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2019 වර්ෂයේදී අත්සන් තබා ඇති බවත්;

(ii) එහෙත්, එම ගැසට් නිවේදනය මේ වනතෙක් ප්‍රකාශයට පත් කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් නිවේදනය අනුව සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට ඇතුළත් කිරීමට යෝජිතව තිබූ එක් එක් රක්ෂිත වනාන්තරය සහ ඒවායේ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(ii) එම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාද වීමට බලපාන ලද හේතු කවරේද;

(iii) ඉහත සඳහන් ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

310/2024

ගරු හේෂා විතානගේ මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මකව පවතින මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් රජයේ ලියාපදිංචි වී ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ ලියාපදිංචියකින් තොරව පෙර පාසල් පවත්වාගෙන යා හැකිද;

(iv) පෙර පාසල් අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(v) පෙර පාසලක් පවත්වාගෙන යාම සඳහා සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

357/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ මහේස්ත්‍රාත් අධිකරණවල සහ මහාධිකරණවල විභාග වන ළමා අපචාරවලට අදාළ නඩු සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාව, නඩු විභාගය ආරම්භ කර වර්ෂ 2, 4, 6, 8 සහ 10 යන කාල වර්ගීකරණය මත පදනම්ව එක් එක් දිස්ත්‍රික්කය අනුව;

(iii) වර්ෂ 2020 සිට මේ දක්වා අධිකරණ කටයුතු වලට යොමු වී නොමැති නමුත් ශ්‍රී ලංකා පොලිසියට හෝ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත කර ඇති ළමා අපචාර පැමිණිලි සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව;

(iv) වර්ෂ 2018 සිට 2022 දක්වා සිදු වී ඇති ළමා අපචාර හේතුවෙන් ලිංගික හිංසනයට ලක් වී ඇති දරුවන් සංඛ්‍යාව ස්ත්‍රී හා පුරුෂ සමාජභාවය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොලිසියට හෝ අධිකාරියට වාර්තා නොවන ළමා අපචාර සම්බන්ධයෙන් දත්ත තිබේද;

(ii) එසේ නම්, එම ළමා අපචාර සංඛ්‍යාව වාර්ෂිකව කොපමණද;

(iii) පසුගිය වර්ෂ දෙක තුළ ළමා අපචාර ක්‍රමිකව වර්ධනය වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

(v) ළමා අපචාර සම්බන්ධයෙන් යුක්තිය පසිඳලීමේ ප්‍රමාදය වළක්වා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

367/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයට, පළාත් සභාවලට සහ පෞද්ගලික අංශයට අයත් රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) එම රෝහල්වල ඇති ඇඳන් සංඛ්‍යාව;

(iii) මධ්‍යම රජයේ හා පළාත් සභා රෝහල්වල ස්ථාපිත කර ඇති හදිසි ප්‍රතිකාර සේවා ඒකකවල ඇඳන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිටින ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව;

(ii) මේ වනවිට සේවයේ යෙදී සිටින හෙද නිලධාරීන් හා හෙදි නිලධාරිනියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iii) වෛද්‍ය, හෙද හැර රජයේ රෝහල්වල සේවය කරනු ලබන අනෙකුත් සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින වෛද්‍ය-රෝගීන් අනුපාතය සහ රෝගීන්-ඇඳන් අනුපාතය වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

372/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 අප්‍රේල් 21 දින සිදු කරන ලද පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාව තුළ පුපුරන ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, පුපුරන ද්‍රව්‍ය අත්අඩංගුවට ගත් ස්ථානය, පුපුරන ද්‍රව්‍ය වර්ගය, ප්‍රමාණය, එහිදී අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් පදිංචි ස්ථාන සහ අදාළ විමර්ශනවල ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් ජාතික ආරක්ෂක කවුන්සලය දැනුම්වත් කර තිබේද;

(iv) එසේ දැනුම්වත් කරන ලද දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

379/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින් ගිවිසුම්) සඳහා යොමුවීමට හේතු කවරේද;

(ii) වර්ෂ 2010 සිට මේ දක්වා සංස්ථාව විසින් ඉදිරි සුරැකුම් ගනුදෙනු සිදු කරන ලද මූල්‍ය ආයතන එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත කාලය තුළදී සිදු කරන ලද ඉදිරි සුරැකුම් ගනුදෙනුවලින් ලැබූ ලාභය/ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ඉදිරි සුරැකුම් ගනුදෙනුවලදී ඉහත සංස්ථාව නියෝජනය කරන ලද නිලධාරීන්/පුද්ගලයින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරි සුරැකුම් ගනුදෙනු හේතුවෙන් සිදු වූ අලාභ, වත්මන් ඉන්ධන මිල වැඩිවීම කෙරෙහි බලපා තිබේද;

(ii) එසේ නම්, එම බලපෑම අවම කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ඉදිරියටත් මෙවැනි අලාභ සිදුවිය හැකි ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට එළැඹීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

465/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා පරිමාණ බලශක්ති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ව්‍යාපෘති මඟින් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිත විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මඟින් විදුලි ඒකකයක මිල කෙරෙහි සිදු වන බලපෑම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1243/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට ජනතාව අතර බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජනතාව අතර බෙදා දී ඇති ඉඩම් සඳහා මේ වනවිට ඔප්පු ලබා දී තිබේද;

(ii) එසේ නම්, වර්ෂ 2021 සිට මේ දක්වා පදිංචිකරුවන් සහ වගාකරුවන් වෙත ලබා දී ඇති ඔප්පු සංඛ්‍යාව සහ ඊට අදාළ ඉඩම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔප්පු ලබා දී නොමැති ඉඩම් සඳහා ඉදිරියේදී ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2082/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම සඳහා සහ එම මණ්ඩලයේ වෙනත් කටයුතු සඳහා කුලියට ගෙන ඇති ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත ගොඩනැගිලි සඳහා ගෙවා ඇති කුලී මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය පාඩු ලබන අවස්ථාවක අධික මිළ ගණන් යටතේ ගොඩනැගිලි කුලියට ගැනීම නොකළ යුතු බව පිළිගන්නේද;

(iv) මෙම තත්වය පාලනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?